**ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 27 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 02 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත .මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 වියදම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයකට හා මූලධන වැය විෂයයන් 2ක් සඳහා සළසා තිබුණු එකතුව රු.1,750,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් විදේශීය ගමන් සීමා කිරීම නිසාත්, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1596/304/134 වූ " රාජ්‍ය වියදම් සමාලෝචනය" අනුව වියදම් සීමා කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබූ බැවින් මෙම වැය විෂය යටතේ වෙන් වී තිබූ රු.17,500,000ක සම්පූර්ණ ප්‍රතිපාදන අවුරා තබන ලෙස 2021.09.08 දින අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් දන්වන ලදී. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 9 කට හා මූලධන වැය විෂයයන් 3 ක් සඳහා එකතුව රු.38,164,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.28,326,231 ක් උපයෝජනය කළ පසු රු.9,837,769 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයන් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක සිට සියයට 92 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1596/304/134 වූ " රාජ්‍ය වියදම් සමාලෝචනය" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඊට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, රු.9,092,890 ක ප්‍රතිපාදන ප්‍රමාණයන් අවුරා තබන ලෙස (*freeze*) 2021.09.08 දින අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවට දන්වා ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | 2021 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ මුදල් වැය කිරීම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම සහ වෙනත් ආයෝජන අත්කර ගැනීම යටතේ රු.6,641,072ක් දැක්විය යුතුව තිබුණි. හැකියා වර්ධනය සඳහා වැය කළ රු.545,267 ක වියදම ද ඇතුළත් කර රු.7,186,339 ක ගෙවීම භෞතික වත්කම් | ඒසීඒ - 2(ii) හි රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදමෙහි එකතුව වන රු.7,186,339.00 ක වියදම රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 මගින් හඳුන්වා දුන් මුදල් ප්‍රවාහ ප්‍රකාශ ආකෘතියෙහි ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය යටතේ "භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්" යටතේ දක්වා ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව සඳහන් කර ඇති භෞතික වත්කම් අත්පත් කර ගැනීම්වල වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වර්ෂයේ, මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම වටිනාකමට සමාන විය යුතු වීම |

ඉදිකිරීම හෝ මිලදී ගැනීම සහ වෙනත් ආයෝජන යටතේ සඳහන් කර තිබුණි.

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදය | දෙපාර්තමේන්තුව සතු වාහන වල ඉන්ධන දහනයවීම පරීක්ෂා කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර දෙපාර්තමේන්තුවේ වාහනවල ඉන්ධන දහනයවීම් පරික්ෂා කර නොතිබුණි. | අංක 30/2016 දරන 2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සංචිත වාහනවල ඉන්ධන පරීක්ෂණයන් සිදු කර ලොග් සටහන් පොත්වල සටහන් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර සටහන් කළ යුතු වීම. |
| (ආ) | මු.රෙ. 1645 (අ) | ක්‍රමවත් හා විධිමත් ලෙස සම්පූර්ණ කර වාහන ලොග් සටහන් පවත්වාගෙන යා යුතු වුවද, වාහන ලොග් පොත් පවත්වාගෙන යාමේ අඩුපාඩු නිරීක්ෂණය විය. | මු.රෙ 1645(අ) ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් ක්‍රමවත්ව හා විධිමත් ලෙස සම්පූර්ණ කර ඇත. | අඩුපාඩු සම්පූර්ණ කර මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රමවත් හා විධිමත් ලෙස වාහන ලොග් පොත් පවත්වා ගත යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී පාඩු හා කපා හැරීම් සම්බන්ධව ඉල්ලීම් 59 ක් ලැබී තිබූ අතර ඉන් 43 ක් සම්බන්ධයෙන් පමණක් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අවසන් කර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වන පාඩු, කපාහැරීම් හා අත්හැර දැමීම් සම්බන්ධ ඉල්ලීම් අධ්‍යයනය කර එම හානි, පාඩු, අත්හැර දැමීම් අයකර ගැනීමට තවදුරටත් ගත හැකි ක්‍රියාමාර්ග නිරීක්ෂණය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් සලකා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මෙම දෙපාර්තමේන්තුවට නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා අදාළ අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුවට ආපසු යොමුකරන අතර, අදාළ සිදුවීම සම්බන්ධයෙන් තවදුරටත් නිරාකරණය කර ගත යුතු කරුණු නිරීක්ෂණය වන්නේ නම් හෝ ඉදිරිපත් කර ඇති ලියවිලිවල අඩුපාඩු නිරීක්ෂණය වන්නේ නම් ඒ පිළිබඳ තවදුරටත් සොයාබැලීමට ද කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම කාර්යක්ෂමව කළ යුතු වීම. |
| (ආ) | 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අරමුදල් 13ක් වසා දැමීමට නිර්දේශ කර තිබුණද, ඉන් අරමුදල් 09 ක පැවැති රු.1,769,693,149 ක් භාණ්ඩාගාරය වෙත ලබා ගැනීමෙන් පසු එම අරමුදල් වසා දමා තිබුණි. අනෙකුත් අරමුදල් හතර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු නිමකර නොතිබුණි. | අරමුදල් දෙකක් නැවත ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින අතර, තවත් අරමුදලක ණය ශේෂ අයකර ගත යුතුව පවතින බැවින්, එම ණය ශේෂ අයකර ගැනීමෙන් පසුව එම අරමුදල වසා දැමීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ඇ) | 2015 අයවැය යෝජනාවක් මත ආරම්භ කෙරුණු රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීම හා සම්මත කර ගැනීම 2021 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීම කිරීමේ කාර්යයන් තාවකාලිකව අත්හිටුවීමට භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් ලැබී ඇති අතර 2020.01.20 දින භාණ්ඩාගාර ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී ලද උපදෙස් අනුව පසුගිය | අයවැය යෝජනා වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

වර්ෂවල රාජ්‍ය මූල්‍ය සම්බන්ධ චක්‍රලේඛ අවලංගු කර 2020.08.28 දිනැති 01/2020 හා 02/2020 චක්‍රලේඛ නිකුත් කර ඇත.

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩු වී පැවති තනතුරු 15 කින් තනතුරු 08 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා මේ වන විට නිලධාරීන් 07 අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත. කෙසේ වුවද, 2022 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් දෙදෙනෙකු ස්ථාන මාරු වී ඇත. එසේම තවදුරටත් පවත්න පුරප්පාඩු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |